# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2423/22 - 2025 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2025.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2022/142.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.05.22 දිනැති හා අංක 2385/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.05.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මග්ගොන, දියගොඩ පාර, සාන්ත වින්සෙන්ති නිවස, අංක 524/4 හි පදිංචි එස්. පුෂ්පරාණි මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් මග්ගොන, දියලගොඩ පාර, සාන්ත වින්සෙන්ති නිවස හි පදිංචි ඩී. පී. ජී. සුහාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/19/2024 හා 2024.12.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජනවාරි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A - G 043730 - 11 (2025/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

යොමු අංකය : IR/COM/02/2022/142
නඩු අංකය : A/19/2024

එස්. පුෂ්පාරාණි මිය,
අංක 524/4,
සාන්ත වින්සෙන්ති නිවස,
දියලගොඩ පාර,
මග්ගොන.

*පළමු පාර්ශ්වය*

ඩී. ජී. සුභාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා,
සාන්ත වින්සෙන්ති නිවස,
දියලගොඩ පාර,
මග්ගොන.

*දෙවන පාර්ශ්වය*

පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම.
නීතිඥ දසාන් ධර්මසේන මහතා,

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම
නීතිඥ සුදර්ශ ඩී. ද සිල්වා මහතා

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා  අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2024 මැයි 16 දිනැති ලිපියෙන් මා පත් කර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කරුණු**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ 2024 මැයි මස 02 දිනැති ලිපියෙන් දන්වා ඇත්තේ සාන්ත වින්සෙන්ති නිවසෙහි සේවය කළ එස්. පුෂ්පරාණි මහත්මියගේ සේවය අත්හිටවූ බවට ඇය විසින් කරනු ලබන ප්‍රකාශය අනුව ඇයගේ රැකියාව අහිමි වී පවති ද අහිමි වී ඇත්නම් ඇයට යම් සහනයක් හිමිවේද එසේ සහනයන් හිමිවිය යුතු නම් හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම පරීක්ෂණ 2024 ජුනි 03 දිනට මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුල සෑම දිනකම දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදි.

පලමු පාර්ශ්වකාරිය වන එස්. පුෂ්පරාණි මහත්මිය අසනීප බැවින් 2024 ජුනි 03 දින නොපැමිණියද ඒ වෙනුවෙන් ඇගේ ස්වාමි පුරුෂයා පැමිණ සිටින ලදි. (නමුත් විවාහ සහතිකය හෝ බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් නොකරන ලදි.)

දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ඉද්දමල්ගොඩ මෙනවිය පෙනී සිටි ශාන්ත වින්සෙන්ති නිවාස භාරකරු පූජ්‍ය සපරමාදු පියතුමා පැමිණ සිටි. එදින ඩී. පී. ජී. සුභාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමාට පැමිණීමට නොහැකි බවත් ඊළඟ දිනයේ සිට පැමිණෙන බවත් දන්වන ලදී.

2024/05/27 වන දින ලිපිය මගින් සම්පූර්ණ විස්තර ප්‍රකාශ (මූල්‍යයය අගයයන් ඇත්නම් ඒ පිළිබඳව විස්තර ප්‍රකාශය) පිටපත් 3 ක් රැගෙන එන ලෙසට දන්වා සිටියද අද දින එම විස්තර ප්‍රකාශ දෙපාර්ශ්වයම ඉදිරිපත් නොකරයි.

මෙම පරීක්ෂණ 2024 ජූලි 07 දින කැඳවූ අවස්ථාවේ පළමු පාර්ශ්වය වෙනුවෙන් එච්. සී. ඊ. පීරිස් මහතා පෙනී සිටී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ඩී. පී. ජී. සුභාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා සමග නීතිඥ සුදර්ශ ඩී. ද සිල්වා මහතා පෙනී සිටී.

සාක්ෂිකාරිය ප්‍රතිඥා දීමෙන් පසුව සාක්ෂි ලබා දෙයි.

සාක්ෂිකාරිය සාන්ත වින්සෙන්ති නිවසේ සේවය සඳහා 2012.09.24 වෙනි දින සිට සේවයට බැඳී තිබේ. ඇයට 2016.06.01 දින සිට දෛනිකව ගෙවන ලද වැටුප මාසිකව වැටුපක් ලෙසට මාරුකර නිවාඩු ද ලබා දී ඇත. වර්ෂ අවසානයේ ඇයට ඉතිරි නිවාඩු වලට ගෙවීම් කරන බවට ද දන්වා ඇත. එම ලිපිය ඇය විසින් භාර ගෙන අත්සන් කර ඇත.

2014.04.23 දිනැති ලිපියෙන් ඇයට සහ ඇගේ ස්වාමි පුරුෂයාට 2012.09.24 පදිංචියට එම ආයතනය තුල කොන්දේසි නවයක් (09) සහිත ලිපියකින් නිවසක් භාර දී ඇත. එම ලිපිය ඇය අත්සන් කර භාරගත් බවට පිලි ගනී. සාක්ෂිකාරිය විසින් 2016.09.30 දිනැති ලිපිය ඇය 2016/10/03 දින භාරගෙන ඇත. එහි සඳහන් කර ඇත්තේ ඇයගේ ස්වාමිපුරුෂයා වන කේ. ඒ. ඩී. ජෙරී නානායක්කාර යන අයගේ සේවය 2016.09.25 සිට අත්හිටුවා ඇති බැවින් 2016.10.15 න් පසු එම නිවසේ සිටිය නොහැකි බවත් ඇය පිටත සිට සේවයට පැමිණිය යුතු බවත් ය. ඇය සේවයට පිටත සිට පැමිණි බව දන්වා සිටියද ඇය විසින් කිසිම ලේඛනයක් අත්සන් කර නැත. ඇය දන්වා සිටින්නේ ඇයට සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමයි. පරීක්ෂණයේ දී පෙනී යන්නේ ඇය සේවයට වාර්තා නොකිරීමයි.

පලමු වන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවූ එස්. පුෂ්පරාණිගේ ස්වාමිපුරුෂයා වන කේ. ඒ. ඩී. ජෙරී නානායක්කාර ප්‍රතිඥා දීමෙන් පසුව සාක්ෂි ලබා දීමේ දී ලබා දී ඇති සාක්ෂිවල 75% ප්‍රමාණයේ සාක්ෂි සාවද්‍ය සහ මඩ ගැසීමේ චේතනාවෙන් කරන ලද ප්‍රකාශ බවට නිර්දේශ කරන අතර ඔහුගේ සාක්ෂි නිෂ්ප්‍රභා කරන බවත්ය.

**නිරීක්ෂණ**

1). පළමුවැනි පාර්ශ්වය ඉල්ලා සිටින්නේ ඇයට රුපියල් 1,000,000/- ක වන්දියක් ලබා දීමටය.

2). ඇයගේ ස්වාමිපුරුෂයා විසින් පළමුවැනි පාර්ශ්වයට ලබා දී ඇති පොරොන්දු පත්‍රයේ සාක්ෂිකරු වශයෙන් අත්සන් කර තිබේ.

3). ඉහත සඳහන් කොන්දේසි අනුව පළමුවැනි පාර්ශ්වය එම නිවස ඇති අංක 10 දරන ලිපිය අනුව භාරදිය යුතුය.

4). තව ද පළමු වැනි පාර්ශ්වය විසින් එම නිවසේ සිටින නේවාසික දරුවන්ට දුම්කොල ලබා දී වරදක් කළ බව ද පිළිගෙන තිබේ.

5). තවද එම ආයතනයේ පළමු වැනි පාර්ශ්වය සේවයේ යෙදී සිටින විටදී දෙවැනි පාර්ශ්වය සඳහා නම් කර නඩු පවරා ඇත්තේ එම ආයතනයේ එම අවස්ථාවේදී සේවය නොකරන අයෙක් වෙනුවෙන් ය.

**තීරණය**

(1). 2014.04.23 දිනැති නිවාස අංක 10 යටතේ ලබා දී ඇති නිවස දෙවන පාර්ශ්වයට කිසිදු වන්දි මුදලකින් තොරව වහාම භාර දෙන ලෙසට නියෝග කරමි.

(2). ඉදිරිපත් කරන ලද ලේඛන සහ සාක්ෂි වලින් තීරණය කළේ ඉල්ලුම්කාරියට කිසිදු අසාධාරණයක් සිදු නොවී ඇති බවත්ය.

(3). නිවසෙන් ඉවත් වීමට කටයුතු කිරීම වෙනුවෙන් රු. ලක්ෂයක (රු. 100,000.00) සානුකම්පිත දීමනාවක් ගෙවීමට පරීක්ෂණයේදී දෙවන පාර්ශ්වය එකඟ වී ඇති බැවින් එම මුදල මෙම ප්‍රදානය *ගැසට්* ගත වී සති දෙකක් ඇතුළත ගෙවීමට කටයුතු කර ඒ බව කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කරන මෙන් නියෝග කරමි.

(4). බේරුම්කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවේ.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

**කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්,**
බේරුම්කරු.

2024 දෙසැම්බර් මස 09 දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

EOG 02 – 0119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.